*සැ. යු.*- 2017.11.24 දින පළ වූ අංක 2,047 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,048 - 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 1192 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1193 |

*සැ. යු.* - සුරුකුම්පත් විනිමය පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 දෙසැම්බර් මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පිස්කල් විකිණීම්

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මොරටුව දිසා අධිකරණයේ දී ය.

මහජන බැංකුව,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*නඩු අංකය :* 141/14/එම්බී

........................................*පැමිණිලිකරු.*

*එදිරිව*

විරහැන්නැදිගේ වීරබල ජයසූරිය පටබැඳිගේ ඇන්තනී දිනේෂ් නිශේන්ද්‍ර ප්‍රනාන්දු
අංක 311/බී, හීනටියන්ගල පාර, නාගොඩ, කළුතර.

..............................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 10 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරුට එරෙහිව පැමිණිලිකරු වෙත රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු. 750,000.00) මුදලක් සහ 2011.06.01 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු. 750,000.00) මුදලක් මත 16% ක වාර්ෂික පොළී අනුපාතිකයක වන පොළියක්ද, රුපියල් හාරලක්ෂ හතලිස් හතර දහස් පන්සිය තිස්දෙකයි ශත හැත්තෑ පහක (රු. 444,532.75) මුදලක් සහ රුපියල් හාරලක්ෂ හතලිස් හතර දහස් පන්සිය තිස්දෙකයි ශත හැත්තෑ පහක (රු. 444,532.75) මුදලක් මත 2011.06.04 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා 15% ක වාර්ෂික පොළී අනුපාතිකයක වන පොළියක් ද, තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යොදවා එකී මුදල් පැමිණිලිකරු වෙත ගෙවනු ලබන දිනය තෙක්, එකී මුදල් මත නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරන ලද නඩු ගාස්තු ද පැමිණිලිකරුට ගෙවන ලෙසට නියෝග කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට මෙම විත්තිකරු අපොහොසත් වී පැහැර හරින්නේ නම්, එකී මුදල අයකර පැමිණිලිකරුට දීම සඳහා ගරු අධිකරණයේ 2015.08.10 දිනැති නියෝගය ප්‍රකාරව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 237 වගන්තිය ප්‍රකාරව දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති විත්තිකරුට අයත් විත්තිකරුගේ ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින්, ඉහත කී මුදල් තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් (02) ඇතුළත පැමිණිලිකරුට ගෙවිය යුතු බවට සහ එසේ ගෙවීම පැහැර හැර ඇති බැවින්, මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති එකී ඉඩම සහ එහි හිමිකම් අධිකරණයේ පිස්කල් මගින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට, වැඩිදුරටත් ආඥකර ඇති හෙයින්ද,

එකී වෙන්දේසිය පැවැත්වීම ගරු අධිකරණය විසින් මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් දේපළ, ඒවා පිහිටි ස්ථානයේදීම වර්ෂ 2017 දෙසැම්බර් මස 13 වැනි දින පෙ.ව. 10.00ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපළ මිලදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25% ක්ද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව පිස්කල්ගේ ගාස්තු ද, විකුණුම් සඳහා වන සියලු වියදම්ද එම වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතු අතර, ගැණුම් මිලෙන් ඉතිරි 75%ක මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කල යුතු ය.

*දේපළට ප්‍රවේශ මාර්ගය.-* මොරටුව නගරයේ සිට නව ගාළු පාර ඔස්සේ කි.මී. 5.2 ක් පමණ ගිය විට වම් පසින් හමුවන ප්‍රේමචන්ද්‍ර ඉන්ධන පිරවුම්හල අසලින් ඇති ජයන්ති පටුමගේ මීටර් 100ක් පමණ යන විට දකුණු පසින් හමුවන ශ්‍රම ශක්ති මාවතේ මීටර් 100ක් පමණ ගිය විට හමුවන තෙමන් සංධියෙන් වම් පසට හැරී මීටර් 25ක් පමණ ගමන් කල විට පාරේ දකුණු පසින් මෙම ඉඩම පිහිටා ඇත.

#### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ, මොරටුව ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාසයේ, අංක 55A කටුකුරුන්ද ග්‍රාම නිලධාරි වසමේ එගොඩ උයන, ශ්‍රම ශක්ති මාවතේ, වරිපනම් අංක 68/9 දරන ස්ථානයේ පිහිටි "දෙඹගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මානක කේ.ටී.එම්.ඩබ්. සමරනායක මහතා විසින් 2007.05.25 වැනි දින මැන බෙද වෙන්කරන ලද අංක 3225 දරන පිඹුර ප්‍රකාර බෙද වෙන්කළ ලොට් අංක 06 දරන කොටසට මායිම් :-

උතුරට : ශ්‍රම ශක්ති මාවතේ වරිපනම් අංක 68/11 සහ ශ්‍රම ශක්ති මාවත ද,
නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ජේ. ඩබ්. රුද්‍රිගෝ මහතාගේ අංක 2661 දරන පිඹුරේ ලොට් අංක 01 ද,
දකුණට : රොස්ලින් ප්‍රනාන්දු සහ තවත් අයට අයත් ඉඩම ද,
බස්නාහිරට : එම්. දයානන්දට අයිති ඉඩම සහ ශ්‍රම ශක්ති මාවතේ වරිපනම් අංක 68/11 දරන ඉඩම ද,

යන මෙකී මායිම් තුළ වූ පර්චස් විස්සයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.20.75) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම දේපළ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක M/3066/161, 200 පත්‍රිකාවල ලියාපදිංචි වී ඇත.

ඩබ්. එස්. ෆොන්සේකා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මොරටුව.

2017 නොවැම්බර් මස 06 වැනි දින,
දිසා අධිකරණය, මොරටුව දී ය.

11-1272

# විවිධ දැන්වීම්

## ජේ. සී. අලවතුවල පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

හෙක්ටර් අප්පුහාමි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ජේ. සී. අලවතුවල පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

1. පාසල් ළමුන් සඳහා අභිප්‍රේරණ වැඩසටහන් තුළින් ඔවුන් සංවේදී කිරීම ;

2. රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම ;

3. විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම ;

යනාදිය වේ.

හෙක්ටර් අප්පුහාමි,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
සභාපති, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව,
පුත්තලම දිස්ත්‍රික්කය.

11-1444

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.